


# ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවට දේශපාලන බලපෑම්

**ක්‍රීඩා අමාත්‍යංශයේ ලේකම් හා අධ්‍යක්ෂ ජනරාල් අතර මත ගැටුමෙන් හෙළිදරව් වෙයි**

ශ්‍රී ලංකාවේ ක්‍රීඩා පරිපාලනය සඳහා ස්වාධීන පරිපාලන මණ්ඩල පත්කිරීම සිදුකළත් ඒ සඳහා දියත් දිගටම දේශපාලන ඇඟිලි ගැසීම් සිදුවන බව ඒත්තු ගැන්වෙන තොරතුරු රැසක් පසුගියදා කරළියට පැමිණ තිබිණි. ඉන් කියැවුණේ ඇතැම් ක්‍රීඩා පරිපාලන ව්‍යුහයේ විසුරුවා හැරීමට දේශපාලනඥයන් සෘජුව මැදිහත්වන බවයි. මේ බැව් අනාවරණය කර තිබුණේ ක්‍රීඩා අමාත්‍යංශයේ පරිපාලන බලවතා ලෙස සැලකෙන ක්‍රීඩා අමාත්‍යංශ ලේකම් එස්. රනුන්ගේ මහතාවීම විශේෂත්ත්වයකි. පසුගිය දිනෙක කොළඹ ක්‍රීඩා විද්‍යායතනයේ පැවැති පරිගණක ඒකකය විවෘත කිරීමේ උත්සවයට සහභාගීවෙමින් ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් එස්. රනුන්ගේ මහතා ක්‍රිකට් පරිපාලනය විසුරුවා හැර අතුරු පාලක මණ්ඩලයක් පත්කළේ ජනාධිපතිනී චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියගේ නියෝගයක් මතයැයි ප්‍රකාශ කර තිබිණි. එම ප්‍රවෘත්තියට ශ්‍රී ලංකාවේ සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යම පාහේ අවධානය යොමුකර තිබුණු අතර ක්‍රීඩා ඇමැති ජීවන් කුමාරතුංග මහතා එම ක්‍රිකට් අතුරු පාලක මණ්ඩලය පත්කිරීම සඳහා තමන්ට නියෝග නිකුත් කළ බවත් ඔහු ප්‍රකාශ කළ බැව් ද වාර්තා විය.

ක්‍රිකට් පරිපාලනය සඳහා අතුරු පාලකයක් පත්කිරිම මගින් ක්‍රීඩා ඇමැතිවරයා තම බිරියගේ සොහොයුරාද එම පරිපාලනයට ඇතුළත් කොට මුල්‍යමය ප්‍රතිලාභ ලබා ගැනීමට අවසර උදාකර දුන් බව එකළ ප්‍රතිවාදීන් චෝදනා කර තිබිණ.

විදේශ තරග සංචාර සඳහා නිලධාරියෙක් වශයෙන් සහභාගිවීම, පරිපාලන කටයුතු වෙනුවෙන් වැය කරනු ලබන මුදල් පිල්ලි ගැසීම, විදේශයන්ගෙන් ක්‍රීඩාව සංවර්ධනය කිරීම සඳහා ලැබෙන මුදල් වලින් කොටසක් තම ගිණුමට ඇතුළත් කර ගැනීම වැනි කාරණාවන්ගෙන් දේශීය ක්‍රීඩා පරිපාලනය පිරී පවතී. සැරව ගලන තුවාලයක් බඳු මෙම ක්‍රීඩා පරිපාලනයට උචිත ඖෂධ ලබාදීමට කිසිදු ක්‍රීඩා බලධාරියෙක් ක්‍රියා නොකරන බැව් විචාරකයෝ චෝදනා නගන්නේ මෙවැනි පරිසරයක සිටය. සත්‍ය වශයෙන්ම දියුණු වන තෙවැනි ලෝකයේ රටක් වන ශ්‍රී ලංකාව තුළ ද සෑම මාර්ගයකින්ම මුදල් ඩැහැ ගනිමින් තම ජීවන අවශ්‍යතා සපුරා ගැනීමට තැත් දරණ පුද්ගලයන් පිරිසක් ඇති බවත් ක්‍රීඩා අමාත්‍යංශයටත්. දේශපාලනයටත් ස්වාධීන ක්‍රීඩා පරිපාලනයටත් එක්වන්නේ ඔවුන්ම බැව් යළි යළිත් තහවුරු කරනු ලබන සිදුවීම් මෙමගින් අනාවරණය වෙයි.

රට තුළ ක්‍රියාවට නංවා ඇතැයි ක්‍රීඩාවක පරිපාලනය සඳහා නීත්‍යානුකූලව ඡන්ද බලයෙන් පත්වන ක්‍රීඩා ව්‍යුහයක් විසුරුවා හැර ඒ වෙනුවට තම හිතවතුන්ගෙන් එම පරිපාලනය අතුරු පාලනයක් ලෙස පවත්වා ගෙන යාමට ක්‍රියා කිරිමෙන් දේශීය ක්‍රීඩා ක්ෂේත්‍රයට බලපෑම් කර ඇති දේශපාලනයේ තරම වටහා ගත හැකිය. ක්‍රිකට් පරිපාලනයට අමතරව බොහෝ ක්‍රීඩා සංගම් විසුරුවා හැර අතුරු පාලක පත්කිරීමට පසුගිය කාලයේ ක්‍රීඩා බලධාරින් කටයුතු කළේ තම හිතවතුන් පිනවීමට මිස පරිපාලනය විධිමත් කිරිමට නොවන බව ඉන් පෙනී යයි. ඒ අනුව බලන කල මෙම තත්ත්වය වහා වෙනස් කරගත නොහැකි වුවහොත් එය අනාගතයට ගැටලුවක් වීම වළකනු නොහැකි බැව් විචාරකයෝ පවසති

**චමින්ද සමන් කුමාර**

# ICC President congratulates Australia on Johnnie Walker Super Series victory

**Jon Long - ICC**

ICC President Ehsan Mani today congratulated Australia on its victory in the Johnnie Walker Super Series Test match over the ICC World XI and thanked Cricket Australia and the venues for hosting a world class event.

"The Australia cricket team can take great pride in beating the ICC World XI in all four Johnnie Walker Super Series matches. They have performed exceptionally well over the three One-Day Internationals and one-off Super Test and have confirmed their status as the world's best team," said Mr Mani.


Vernon J (Snni)

"They have achieved this feat at two venues that were well-prepared for cricket at a time that falls outside the regular international season in Australia and I thank Cricket Australia, the host venues and the Governments of Victoria and New South Wales for their hard work in staging a world-class event. "Though not all the players have been able to find the world class form that earned them selection for the ICC World XI, it has been pleasing that all of the matches have been played in the true spirit of the game. "In addition, throughout the event the players have supported international cricket's partnership with the Joint United Nations Programme on HIV/AIDS (UNAIDS). Players from both teams have worn shirts with awareness-raising red-ribbons integrated into the design, helping to raise awareness and reduce stigma in relation to the pandemic that is prevalent in many of the major cricket playing countries.

"In keeping with the unique spirit of the sport, the event has also contributed to the earthquake relief efforts in Pakistan, helping the Australian Red Cross to raise over $AUS 1.5 mil-




# සාෆ් ක්‍රීඩා උළෙල වෙනුවෙන් කඳුකරයේ පුහුණු වෙනවා

දමයන්ති දර්ශා

**දර්ශා කොහොමද? මොකද මේ දවස්වල කරන්නේ ?**

මම මේ දවස්වලමගේ පුහුණුවීම් කටයුතු කඳුකරයේ සිට කරනවා. ඒ තරම් තදින් පුහුණුවීම් කරන්නේ නැහැ. නමුත් කඳුකරයේ සිට සරළ පුහුණු ආභ්‍යාස කිරීමෙන් මම දරා ගැනීමේ හැකියාව වැඩිදියුණු කරගන්න අපේක්ෂා කරනවා.

**කොහොමද ඉදිරි වසර සැලසුම් කරගෙන තිබෙන්නේ ?**

මම සාෆ් ක්‍රීඩා උළෙලේදී උපරිම දක්ෂතා දක්වන්න බලාගෙනයි ඉන්නේ. ඒ සඳහා පුහුණුවීම් සීග්‍ර කරන්නයි ඉන්නේ.

**ඔබ මීටර් 400 ඉසව්ව අතහැර දමන්න තීරණය කළා නේද?**



ඔව්. මම දැන් මීටර් 400 තරග ඉසව්වට සහභාගි වූණා ඇති කියලා හිතුවා. මොකද එය දැන් මම හරිම වෙහෙසකාරියි. මීටර් 400 ඉසව්වට දුවන්න නම් හුඟක් කැපවෙන්න උවමනායි. නමුත් දැන් මම වසර දොළහකට අධික කාලයක් තිස්සේ දුවනවා. මීටර් 400 ඉසව්වෙන් මම ආසියානු තලය ජයගෙන තිබෙනවා. නමුත් තවදුරටත් මීටර් 400 ට තරග නොවදින්න මම තීරණය කළේ මගේ පුහුණුකරු සුනිල් ගුණවර්ධන මහතාගෙන් ලැබුණු උපදෙස් හා අනුමැතිය ඇතිවයි.

**මීටර් 200 ඔබ දැන් තරග කරන්න බලාපොරොත්තුවන ඉසව්ව වෙලා තිබෙනවා. එය සුසන්තිකා ජයසිංහගේත් ඉසව්ව. මොකද මේ ගැන කියන්න තියෙන්නෙ?**

සුසන්තිකා නොවෙයි වෙන ඕනෑම ක්‍රීඩිකාවකට ඕනෑම තරග ඉසව්වකට දුවන්න. ඒක මට ප්‍රශ්නයක් නොවෙයි. මම දුවන්නෙ මගේ හැකියාවෙන් හා ශක්තියෙන්. සුසන්තිකා මගේ රට වෙනුවෙන්ම, මගේ ධජය යටතේම අන්තර් ජාතික තරග ඉසව් නියෝජනය කරාවි. අපි දෙන්න අතර පුද්ගලික වෛරයක් නැති නිසා එය ප්‍රශ්නයක් නොවන බවයි මට හිතෙන්නෙ.

**සුසන්තිකා හා ඔබ එකම තරග ඉසව්වකට සහභාගිවීම, ඔබ දෙපලගේ මානසික තත්ත්වයට කොහොමද බලපාන්නේ?**

මම හිතන්නේ ආසියාව තුළ දී නම් අපි දෙදෙනාට තිබෙන්නෙ අප සමගම තරග කරන එක විතරයි. ඒ නිසා මම තරග ඉසව්ව අපි දෙදෙනාගේ තරගයක් වේවි. එවිට අපිට රට ගැන කලබල නොවී අපි ගැන සිතා තරග කරන්නයි තිබෙන්නෙ. මොකද කොහොමත් අපි දෙදෙනාගෙන් කෙනෙක් රන් පදක්කම අපේ රටට දිනවලා දෙනවනෙ. ඒ නිසා පුද්ගලිකව අපේ ක්‍රීඩා තරග දක්ෂතාත් ඉහළට යාවී යැයි මම හිතනවා.

**තව කොපමණ කාලයක් ක්‍රීඩාවේ ඉන්න අපේක්ෂා කරනවාද?**

මම නම් මට දුවන්න පුළුවන් තරම් කාලයක්, දක්ෂතා ඉතිරිව තිබෙන කාලයක් දුවනවා. දැන්නම් දේශීය ක්‍රීඩකයන් හොඳ සහයෝගයක් පරිපාලනයෙන් ලැබෙන්නෙ නැහැ. අනාගත ක්‍රීඩකයන් වෙනුවෙන් කතා කරන්න හරි අපි සිටිය යුතුයි නෙ. ඉතින් හැකිතාක් කාලයක් ශ්‍රී ලංකාව වෙනුවෙන් දුවන්න අපේක්ෂා කරනවා.

**අවසන් වශයෙන් කියන්න සාෆ් ක්‍රීඩා උළෙල ගැන ඔබේ බලාපොරොත්තු පිළිබඳව?**

අනිවාර්යයෙන්ම රන් පදක්කමක්. ඒකට මම අභියෝගයක් නැතැ යැයි මම හිතනවා. ඒ සඳහා මම වෙහෙස වී පුහුණු වෙනවා.

**කසුන් අංජන ඉරුගල්බණ්ඩාර**